ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT


චක්‍රලේඛ අංකය : පීඑස්/එස්පී/චක්‍රලේඛ/1/2021
2021 පෙබරවාරි මස 11 වන දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,

**<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම හා කොමිෂන් සභාවට අවශ්‍ය තොරතුරු ලබා දීම</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙන ඇතැම් තීරණ අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් ක්‍රියාත්මක නොකරන අවස්ථා රාශියක් පිළිබඳ, එම කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කර ඇත.

එමෙන්ම, කොමිෂන් සභාව විසින් කැඳවන වාර්තා හා නිරීක්ෂණ ලබාදීම සම්බන්ධවද අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා විෂයභාර නිලධාරීන් දීර්ඝ කාලයක් ගනු ලැබුවත්, වසර කිහිපයක් ගියද එම පිළිතුරු ලබා නොදීම බහුලවම සිදුවන බවද නිරීක්ෂණය කර ඇත. එම නිසා කොමිෂන් සභාව විසින් ලබා දිය යුතු තීන්දු අනපේක්ෂිත ලෙස ප්‍රමාද වන බවද, එය බාහිර පාර්ශවයන්ගේ දෝෂ දර්ශණයට ලක්වීමටද හේතු වී ඇති බවද පෙන්වා දී ඇත. මෙම තත්ත්වයන් වලක්වා ගැනීම සඳහා සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා විෂයභාර නිලධාරීන් කටයුතු කළ යුතු බව අතිගරු ජනාධිපතිතුමා උපදෙස් දී ඇත.

එමෙන්ම, විශ්‍රාමලත් රාජ්‍ය සේවකයන් විවිධ තනතුරු සඳහා පත්කර ගැනීම පිළිබඳවද කොමිෂන් සභාවේ නිරීක්ෂණයට ලක්වී ඇති අතර, වයස අවුරුදු 60 ඉක්මවූ විශ්‍රාමලත් නිලධාරීන් බඳවා ගැනීමේදී අමාත්‍ය මණ්ඩල පූර්ව අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශ ලේකම්වරුන් කටයුතු කිරීම, එවැනි පත්වීම් කිරීමේදී සුවිශේෂිත වූ අවශ්‍යතාවයන් සඳහා විනිවිදභාවයෙන් යුතුව සිදු කිරීම තහවුරුවීමට හේතුවන බව අවධාරණය කර ඇත.

තවද, එම තනතුරු සඳහා සුදුසුකම් ඇති, විශ්‍රාම වයසට ළඟා නොවූ, රාජ්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා අවස්ථා සැලසීම සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාවයට ප්‍රමුඛත්වය දිය යුතු බවද අතිගරු ජනාධිපතිතුමා විසින් අවධාරණය කර ඇත. එබැවින්, අනුප්‍රාප්තික සැලැස්මක් (Succession Plan) යටතේ නිලධාරීන් ඉහළ තනතුරු සඳහා යොමු කිරීමට නිලධාරියා විශ්‍රාම යාමට වසරකට පෙර ඒ සඳහා සුදුසු අනුප්‍රාප්තිකයන් හඳුනාගෙන එම නිලධාරීන්ට වැඩි වගකීම් හා කාර්යභාරයන් පැවරීමටත් කටයුතු කළ යුතුය.

[signature]

පී. බී ජයසුන්දර
ජනාධිපති ලේකම්


ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01
දුරකථන / தொலைபேசி ++ 94 (0) 11 2354418
ෆැක්ස් / தொலைநகல் ++ 94 11 2446657
ඉ-තැපැල / மின்-அஞ்சல் prsec@presidentsoffice.lk